C
634.94
MAN

# මහවැලි "සී" කලාපයේ කෘෂි වන වගා කටයුතු හා සම්බන්ධිත සමාජ ආර්ථික සංදර්භය

එම්. ඒ. එම්. කේ. කේ. මාන්නප්පෙරුම

පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ
භූගෝල විද්‍යා අංශයේ දර්ශනපති උපාධිය
සඳහා
ඉදිරිපත් කරනු ලබන
පර්යේෂණ නිබන්ධනය
1995/96

PERMANENT REFERENCE
FOR USE IN THE
LIBRARY ONLY

භූගෝල විද්‍යා දෙපාර්තමේන්තුව,
පේරාදෙණිය විශ්වවිද්‍යාලය,
පේරාදෙණිය.
2002 මාර්තු

553994

# සාරාංශය

මහවැලි “සී” කලාපයේ කෘෂි වන වගා කටයුතු හා සම්බන්ධිත සමාජ-ආර්ථික සංදර්භය යන මාතෘකාව යටතේ දර්ශනපති උපාධිය සඳහා මෙම පර්යේෂණ කෘතිය ඉදිරිපත් කොට තිබේ. රාජ්‍යමය මැදිහත් වීම යටතේ සංවර්ධනය වන මහවැලි “සී” කලාපයේ ජන ජීවිතය හා කාලීනව වැදගත් වන ගෙවතු කෘෂි වන වගා කටයුතු අතර අන්තර් සම්බන්ධතාවය විග්‍රහ කිරීම මෙහි ප්‍රධානතම අරමුණයි. මෙහි දී විශේෂයෙන් සඳහන් කළ යුතු වන්නේ අධ්‍යයනයට ලක් කළ මහවැලි “සී” කලාපයේ ප්‍රධානතම කෘෂි වන වගාව ලෙස ගෙවතු වගාව ව්‍යාප්ත වී ඇති බවයි. ඊට අමතරව වී ගොවිතැන ආශ්‍රිතව ද කෘෂි වන වගාවෙහි මූලික ලක්ෂණ ප්‍රදේශය තුළ දක්නට ඇතත් මේ පර්යේෂණ කෘතියේ දී වී ගොවිතැන අධ්‍යයනට ලක් කර නොමැත.

මෙම අධ්‍යයනයෙන් පැහැදිලි වන්නේ ගෙවතු කෘෂි වන වගාව ගෘහස්ත ජීවිතය හා බැඳුනු ඵලදායී නිෂ්පාදන පද්ධතියක් බවයි. විවිධ ගෘහස්ත අවශ්‍යතාවයන් පරිපූර්ණ කිරීමට අමතරව වාණිජමය ඉලක්කයකට ගෙවතු කෘෂි වන වගාව මෑත කාලයේ දී යොමු වී ඇති ආකාරය මහවැලි “සී” කලාපය ආශ්‍රයෙන් පැහැදිලි කිරීමක් මෙම පර්යේෂණ කෘතියෙන් සිදු කෙරේ. පර්යේෂණය සඳහා තෝරා ගත් ක්‍රමවේදය, පර්යේෂණ කෘතියෙහි අරමුණු සහ ගෙවතු කෘෂි වන වගාවෙහි වැදගත් කම යන කරුණු කෙරෙහි පළමුවන පරිච්ඡේදයෙන් කරුණු ඉදිරිපත් කර ඇත.

මහවැලි “සී” කලාපයේ ජනපදකරණය ආරම්භ වීමෙන් පසුව වෙනස් කම් රාශියකට භාජනය වූ භෞතික පරිසරය එහි ගෙවතු කෘෂි වන වගාව කෙරෙහි බලපා ඇති ආකාරය මේ පර්යේෂණය මගින් විස්තර සහිතව ඉදිරිපත් කර තිබේ. මෙහිදී උප ඒකක 15 ක් තුළ අවකාශීය වශයෙන් වෙනස් වූ කෘෂි වන වගා නිර්මාණය වී ඇති ආකාරය කෙරෙහි අවධානය යොමු කරමින් දෙවන පරිච්ඡේදය ලිය වී තිබේ.

ඊට අමතරව ගෙවතු කෘෂි වන වගාව සඳහා ශාක විශේෂ තෝරා ගැනීම කෙරෙහි ද භෞතික පරිසරය බලපා ඇති ආකාරය ද, විවිධ රටාවලින් යුතු කෘෂි වන වගා පද්ධති නිර්මාණය වීමට බලපා ඇති වෙනත් හේතූන් ද දත්ත හා තොරතුරු මගින් පැහැදිලි කර තිබේ. මේ හැර ජනපද වාසීහු තමන්ගේ පාරම්පරික දැනුම හා අත්දැකීම් මගින් පාරිසරික ගැටළු නිරාකරණය කර ගැනීමට දරා ඇති උත්සාහය ක්ෂේත්‍ර නිරීක්ෂණ මගින් පැහැදිලි කර තිබේ. සාහිත්‍යමය මූලාශ්‍ර විග්‍රහ කරමින් නෙයාර්ගේ කෘෂි වන වගා පද්ධති වර්ගීකරණය අනුව මහවැලි “සී” කලාපයේ

නිර්මාණය වී ඇති කෘෂි වන වගා රටාවන් විස්තර කර, ප්‍රදේශයේ භෞතික පරිසරය සහ ගෙවතු කෘෂි වන වගාවන් අතර පවතින සම්බන්ධතාවය පරිච්ඡේදයේ දෙවන කොටසින් විස්තර කර තිබේ.

මෙහි තුන්වන පරිච්ඡේදය මගින් ප්‍රදේශයේ සමාජ-ආර්ථික පරිසරය පිළිබඳව ක්ෂේත්‍ර අධ්‍යයනය මගින් ලබා ගත් තොරතුරු ඉදිරිපත් කොට ඇත. ප්‍රදේශයේ ජනපදකරණය සිදු වූ ආකාරයත්, ජනපදකරණයත් සමග එහි ආර්ථික පරිසරය සකස් වී ඇති ආකාරයත් විස්තරාත්මකව ඉදිරිපත් කර තිබේ.

එම පරිච්ඡේදයේ අවසාන කොටස මගින් තෝරා ගත් ඒකක 15 ක් තුළ සමාජ-ආර්ථික වටපිටාව නංවාලීමට මහවැලි ආර්ථික ඒජන්සිය මගින් දරණ ලද දායකත්වය කෙරෙහි ද අවධානය යොමුකොට තිබේ.

මෙම පර්යේෂණයෙහි 4, 5 සහ 6, 7 යන පරිච්ඡේදයන් මූළමනින් ම ක්ෂේත්‍ර අධ්‍යයනයෙන් ලබා ගත් තොරතුරු ආශ්‍රයෙන් ලියැවී තිබේ. තෝරා ගත් අධ්‍යයන ප්‍රදේශයෙහි ගෙවතු කෘෂි වන වගාවන්හි ආරම්භය හා ජනපදිකයින්ගේ මැදිහත් වීම පිළිබඳව දත්ත අඩංගු තොරතුරු 4 වෙනි පරිච්ඡේදය මගින් ඉදිරිපත් කර තිබේ. ඒ මගින් පර්යේෂණයෙහි මූලික අරමුණක් වන ගෙවතු කෘෂි වන වගාව සඳහා තුඩු දී ඇති මානව ආයෝජනත්, අවකාශීය විවිධත්වයට බලපා ඇති සාධකත්, ජනතා ආකල්ප උද්දීපනය කරමින් බිහි වී ඇති විවිධ රටාවන් යනාදියත් විමර්ශනයට ලක් කර තිබේ.

5 වෙනි පරිච්ඡේදය මගින් තෝරා ගත් අධ්‍යයන ප්‍රදේශයේ ජනපදිකයින්ගේ මැදිහත් වීම නිසා නිර්මාණය වූ ගෙවතු කෘෂි වන වගාවන්හි ව්‍යුහය හා සංයුතිය ද, ශාක විශේෂයන්හි ස්තරගත පිහිටීම සහ ඒවායේ ගෘහස්ත සහ වාණිජමය ඵලදාදයීතාවය ද ඉස්මතු කර තිබේ. මේ පරිච්ඡේදය මගින් මහවැලි "සී" කලාපයේ භූ දර්ශනය තුළ අවකාශීය වශයෙන් විවිධ වූ ගෙවතු කෘෂි වන වගා රටාවන් නිර්මාණය වී ඇති ආකාරය පැහැදිලි කර දීමට හැකි වී ඇත.

පර්යේෂණ කෘතියෙහි 6 වෙනි පරිච්ඡේදය මගින් තෝරා ගත් අධ්‍යයන ප්‍රදේශයේ ගෙවතු කෘෂි වන වගාව කෙරෙහි ගොවීන්ට ලබා දී ඇති සීමිත වූ ගොඩ ඉඩම් ප්‍රමාණය බලපා ඇති ආකාරය විග්‍රහ කර තිබේ. අක්කර එකක් පමණ වන සීමිත වූ භූමි ප්‍රමාණය ඵලදායි ලෙස ගෙවතු කෘෂි වන වගාවට යොදා ගෙන ඇති ආකාරය ද, මෙහි ප්‍රවණතාවය කෙරෙහි ඉඩම් ප්‍රශ්නය බලපා ඇති ආකාරය ද මෙම පරිච්ඡේදයෙන් පැහැදිලි කරයි. කෘෂි වන වගාව දිරි ගැන්වීම සඳහා මහවැලි ආර්ථික ඒජන්සියේ දායකත්වය ලැබී ඇති ආකාරය ද එමගින් අනාවරණය කර තිබේ.

7 වෙනි පරිච්ඡේදය මගින් ගෙවතු කෘෂි වන වගාව සම්බන්ධ විවිධ අභියෝගයන් සහ අනාගත අපේක්ෂා පිළිබඳව කරුණු ගෙන හැර දක්වා ඇත. මහවැලි "සී" කලාපයේ මේ අංශයේ දක්නට ඇති ප්‍රවනතා අනුව අනාගතයේ දී ගෙවතු කෘෂි වන වගාව නව දුරටත් වර්ධනය වීමට ඇති ඉඩකඩ ද පැහැදිලි කොට ඇත. අද පවතින ගෙවතු කෘෂි වන වගාවට වඩා වාණිජමය වූ ගෙවතු වගාවක් අනාගතයේ මහවැලි "සී" කලාපය තුළ වර්ධනය වීමට ඇති ඉඩකඩ මෙන්ම, මානව දායකත්වය ඒ සඳහා ලැබීමට ඇති ඉඩකඩ ද සාකච්ඡාකොට ඇත.

මෙම පර්යේෂණ කෘතියෙන් විදහා දැක්වෙන වැදගත් කරුණක් වන්නේ ජනපදිකයන් පෙරාතුව ලබා ගෙන ඇති දැනුම හා අත්දැකීම් තම ජීවනෝපාය සුරක්ෂිත කර ගැනීම සඳහා නව ජනාවාස ප්‍රදේශවල දි උපයෝගි කරගෙන හිතකර පාරිසරික වර්ධනයක් ලබා දී ඇති බවයි.

මෙය මහවැලි "සී" කලාපයෙහි ගෙවතු කෘෂි වන වගාව සහ එහි සමාජ-ආර්ථික පරිසරය අතර වන අන්තර් සම්බන්ධතාව ගෙන හැර දක්වන පර්යේෂණ කෘතියකි. සිංහල මාධ්‍යයෙන් ලියවුණු මේ පර්යේෂණ කෘතිය ගෙවතු කෘෂි වන වගාව පිළිබඳව පර්යේෂණ කාර්යයෙහි නියැලෙන්නන්ට අත්වැලක් වනු ඇත.

UNIVERSITY OF PERADENIYA
12-12-2002
LIBRARY.